## කස්ත්‍රෝගේ ඉවත් වීම හා ජනතාවාදි ගමනේ අවසානය

පිදෙල් කස්ත්‍රෝ ඉවත්වෙලා එයාගෙ මල්ලී ඒ තැන අරගෙන. සාධාරණ ඡන්ද ක්‍රමයක් ඇතත් නැතත් මේ වගේ වෙන රටවල සිදු වන දේට සමාන දෙයක් තමයි මෙතනත් වෙලා තියෙන්නේ.

හැබැයි රාවුල්, පිදෙල් සමඟ එදා ඉඳලම දේශපාලනයේ සිටි කෙනෙක්. එනිසා ඔහු පිදෙල්ට වඩා හුඟක් බාලයි කියලා හිතන්න අමාරුයි.

එදා මේ අය බලයට පත්වෙන කාලෙදී ලෝකය පුරාම පැතිරුණ ජනතාවාදී රැල්ලක් ඇති වෙමින් තිබුණා. මේ ජනතාවාදී රැල්ලට හේතු වුණේ බ්‍රෙට්න්ඩ්වුඩ් වලදී ඇති කරගත් නව ගිවිසුම උඩ ඇරඹුන ධනවාදි සංවර්ධනයයි.

දෙවෙනි ලෝක යුද්ධයෙන් පස්සේ ප්‍රධාන ධනපති රටවල් එදා තිබුණ ජනසතු ආර්ථික තිබුණ රුසියාව ඇතුළු රටවල් සමඟ ගිවිසුමක් ඇති කරගන්න පමණක් නෙවෙයි වැඩ කරන ජනතාව සමඟ තම රටවල් තුළ එකඟතාවයක් ඇති කරගන්න වැඩ කළා.

මේ අනුව සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ හා වෘත්තීය සමිති ලොව පුරාම ඉදිරියට ඇවිත් පාලන තන්ත්‍රයේ හවුල්කරුවන් වුණා. මේ දේශපාලන එකඟතාවයන් තුළයි බ්‍රෙට්න්ඩ්වුඩ් (Bretton Woods) ආර්ථික සැලසුම් එළියට ගන්න පුළුවන් වුණේ.

මේ මූලික අදහස් ගොඩනගල තිබුනේ මුන්යාඩ් කින්ස් (Maynard Keynes) කියන ආර්ථික ඇදුරුතුමා. ලෝක බැංකුව, මූල්‍ය අරමුදල හා දැනට ක්‍රියාත්මක වන ලෝක වෙළඳ ගිවිසුමට අඩිතාලම වැටුනේ මේ ආර්ථික ගිවිසුම් තුළින්.

එකිනෙකා කා කොටා ගන්නා අධිරාජ්‍යවාදී ධනවාදී තත්වයේ ඉඳල ගෝලීය තන්ත්‍රයක් ලෙසට ධනපති බලවේග එකතු වීම ධනපති පංතියට අළුත් අවස්ථාවක් ඇති කළා කිව්වොත් නිවැරදියි.

සීතල යුද්ධය තුළින් ගෝලීය ධනවාදය වේගයෙන් පිම්බෙන්නට පටන් ගත්තා. යටත් විජිතවාදයෙන් එළියට ආපු රටවල්වලටත් මේ ධනපති නැගීම බලපෑවා.

විශේෂයෙන්ම වෙළඳපොළ බලපෑම ග්‍රාමීය පරිසරය තුළට ඇතුල්වෙද්දී ලොකු පෙරළිකාරී තත්වයක් ගම්බද සමාජය තුළ ඇතිවුණා.

ප්‍රාග්ධනය ඒකරාශී වීමේදී සමහරු උඩට යනවා, අනෙක් අය උඩට යාම සඳහා පොර බදනවා. මෙන්න මේ සමාජ ඇවිස්සිල්ල තමයි ජනතාවාදී දේශපාලනයට මුල වුණේ.

උඩට යන්න පොර බදන අය හැමවිටම සමානාත්මතාවය නැත්නම් සමාජවාදය ගැන කථා කරනව. ඒත් එය පුද්ගලික දේපොල ඉවත් කිරීම මුල්වුණ සමාජවාදයට වඩා සුභසාධක සමාජවාදයක්.

ලොවපුරා ඇතිවුණ සෑම ජනතාවාදයක් තුළම මේ විදිහේ එක එක සමාජවාද මතු වුණා. නිකෘමා සමාජවාදය, ගාන්ධි සමාජවාදය, බෞද්ධ සමාජවාදය, සුකර්ණෝ සමාජවාදය ආදි නොයෙක් සමාජවාද නමින් ජනතාවාදී දේශපාලන ඉදිරියට ආවා.

මේ හැම ජනතාවාදී නායකයෙක්ම බටහිර සමඟ නොක්කාඩු හදාගෙන ගැටුම් ඇති කරගෙන රුසියාවත් නැත්නම් චීනයත් සමඟ හවුල් ඇති කරගත්තා. ඒත් රට තුළ පංති සමාජයක් ඇති වෙන එක නැත්නම් අලුත් ධනපතියන් ඇති වෙන එක වර්ධනය කරන්න වැඩ කළා.

ඇත්ත පරණ ධනපති පවුල් ප්‍රතිගාමීන් ලෙස හඳුන්වා වට්ටන්න වැඩ කළා. ඒත් සමහර රටවල ඒ කොටසුත් අළුත් ක්‍රමයට හැඩ ගැහුනා.

ඇත්තටම සිදු වුණේ අළුත් ධනපති කොටස් රට පුරා ඇති වෙන එකයි. විශේෂයෙන් රුසියාව, චීනය ආදී රටවල්වල බලපෑමත් සමඟ රාජ්‍ය අංශයේ වර්ධනයක් ඇති වුණත් ගෝලීය ධනපති ක්‍රමයෙන් මේ ඇත්තෝ මුළුමණින්ම ඉවත් වුනේ නෑ.

එහෙම නොවුන එක රටක් තිබුණ, ඒ තමා කියුබාව. තව රටවල් ගණනාවක් ඒ වගේ ආරුඩයක් ඇති කරගන්න දඟලුවත් ඒ එකකටවත් කියුබානු ගමන යන්න බැරි වුණා.

ඇත්තටම 59 බලයට එනකොටත් පිදෙල් කස්ත්‍රෝ ධනපති ඉලක්කවලින් ඈත් වෙලා හිටියේ නෑ. ඔහුට ජෙපර්සන් වැනි ඇමරිකන් විප්ලවයේ නායකයින් ගැන ලොකු ගෞරවයක් තිබුණා.

ඔහු බලාපොරොත්තු වුණේ බැටිස්ටාගේ ඒකාධිපති දූෂිත පාලනය බිඳල හොඳ වෙළඳ ආර්ථිකයක් ගොඩනගා ගන්නට. ඒ සඳහා ඇමරිකාවෙන් උදව් ලැබෙයි කියලත් ඔහු විශ්වාස කළා.

ඒත් තමන්ගේ දොරකඩ ඇති වන මේ විප්ලවවාදී ගින්න ගැන ඇමරිකන් නායකයෝ බය වුණා. ඒ හින්දා ඔවුන් කැස්ත්‍රෝ දරපු උත්සාහයට දුන්නේ කම්මුල් පාරක්.

කියුබාවෙන් පැනල ආපු දූෂිත හොරුන් සමඟ සම්බන්ධකම් ඇති කරගෙන විප්ලවය අඩාල කරන්නටයි ඇමරිකන් පාලකයෝ උත්සාහ කලේ.

කැස්ත්‍රෝ ඒ අනුව රුසියාවේ ආධාර ගන්නට යොමු වුණා. අනෙක් අතට රුසියාවටත් මේ අල්ලපු අත අතහරින්නම බැරි වුණා. ඇමරිකාවේ දොරකඩට තබපු පය බුරුල් කරල ලෝකය ඉදිරියෙම පහළ වැටෙන්නට රුසියාවට ඕන වුනේ නෑ.

ඒ නිසා වෙන කිසිම රටකට නොදුන් ආධාර උපකාර කරන්නට ඔවුන් පියවර ගත්තා. මේ තමා කියුබානු අළුත් ගමනේ ප්‍රධාන සාධකය.

ලංකාවෙත් 1970 බලයට ආපු ආණ්ඩුව තුළ රුසියාව, නැත්නම් චීනය උපකාර කරගෙන වමට යන්නට ලොකු බලපෑමක් ඇති වුණා. පාරට, පෙළපාලිවලට ආපු අය කිව්වේ "සිරිමාවොට අපි කියන්නේ, කැස්ත්‍රෝ වගේ කෙලින් යන්න" ආදී සටන්පාඨයි.

ඒත් ඒ බලපෑම උඩ වැඩ සිද්ධ වුණේ නෑ. ඒකට මූලික හේතුව රුසියාවවත්, චීනයවත් කියුබාවට ඇතුල් වුණ ආකාරයට අපේ රටට ඇතුල් වුණේ නෑ. වෙනසක් ඇති කරන්න හවුල් වුණොත් නෑ.

ජනතාවාදය, සමාජවාදය ගැන කථා කළත් නිකම්ම සමාජවාදයට යන්නේ නෑ. විශේෂයෙන් කම්කරු පංතිය වෙනම ක්‍රියාකාරන තත්වයක් තුළ වමට යනවා කියන්නේ තමන්ගේ පංති පදනම් විනාශ වීම කියල ජනතාවාදය දන්නව.

ගම්බද පවුල්වලින් එළියට එන උගතුන් තමන්ගේ තැන ලබා ගන්නට නිර්ධනීන්ගේ නම අරගෙන උන්ගේ කර උඩ නැග්ගත්, නිර්ධනීන්ට බලය ලැබෙන හෝ එයට යම්තම්වත් ගැවෙන ගමනකට ඇත්තටම හවුල් වෙන්නේ නෑ.

කියුබාවේදී ගැමි මැද පංතික බලපෑමෙන් මිදිල ඉදිරියට යන්න රුසියන් හවුල උපකාර වුණත්, ලංකාවේදිත්, තව රටවල් ගණනාවකත් එම ගමන සාර්ථක වුණේ නෑ.

"කියුබාවේදී වෙච්ච දෙයක් අපේ රටේදී වෙන්න බැරිද" කියල කෑගහපු අයට ලැබුණ පිළිතුර තමා "බෑ කොහොත්ම බෑ" කියන එක.

දැන් ලෝකය පුරාම ජනතාවාදී නායකයෝ ගෝලීය ධනවාදයේ බැල මෙහෙවරකම් කරනවා. සමාජවාදය ගැන කථාවක්වත් නෑ.

මහින්ද සිරිමාවොටත් වඩා හොඳ ජාතිවාදයෙක්. ඒත් එයා කරගෙන යන්නේ රනිල් ආරම්භ කරපු වැඩ කොටස.

රනිල්ගේ වැඩසටහන විතරක් නෙමේ, ඔහු ළඟ හිටපු ඔස්තාර් ඇමරිකන්කාරයොත් වට කරගෙන තමයි මහින්ද ඉන්නේ.

කැස්ත්‍රෝ ඉවත් වුණ එක ගැන කථා කරන්නවත් කෙනෙක් ලංකා ජනතාවාදය තුළ ඉතිරි වෙලා නෑ, අපි ඇරෙන්නට.